# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

## අ.පො.ස. (උ.පෙළ) - සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

## GENERAL INFORMATION TECHNOLOGY

### පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය - 01

**1 පත්‍රය** **කාලය : පැය 3 යි.**

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 1 බැගින් හිමි වේ.

1. ආදාන උපක්‍රමයක් හා ප්‍රතිදාන උපක්‍රමයක් යන දෙ ආකාරයට ම භාවිත කල හැකි උපාංගය කුමක් ද?


   (1) තීරු කේත කියවනය (2) සංදර්ශකය
   (3) මතක කාඩ් පත (4) ස්පර්ශ තිරය

2. ඔබේ පාසලේ පන්ති කාමර හා විද්‍යාගාරය ජාලගත කිරීමට වඩාත්ම යෝග්‍ය ජාල වර්ගය කුමක්ද?

   (1) LAN (2) WAN (3) VPN (4) MAN

3. 1011011 යන ද්විමය සංඛ්‍යාවෙහි දශමය සංඛ්‍යාව වනුයේ කුමක් ද?

   (1) 78 (2) 81 (3) 82 (4) 91

4. 


   දී ඇති තර්කන පරිපථයේ ලැබිය හැකි ප්‍රතිදානය කුමක්ද?

   (1) $(\bar{A} . \bar{B}) + (\bar{B} . \bar{C})$ (2) $(\bar{A} .B) + (\overline{B.C})$

   (3) $(\bar{A} + \bar{B}) + (\bar{B} . \bar{C})$ (4) $(\bar{A} .B) + (\bar{B} . \bar{C})$

5. ASCII කේත ක්‍රමයේදී D අනුලක්ෂණය 68 දශම සංඛ්‍යාවට සමාන ද්විමය සංඛ්‍යාවෙන් නිරූපනය වේ. පහත දැක්වෙන කුමන ද්විමය සංඛ්‍යාවෙන් ASCII කේතයෙහි B හි අනුලක්ෂණය නිරූපනය වේද?

   (1) 1101010 (2) 1000010
   (3) 1000001 (4) 1000101

6. මෙහෙයුම් පද්ධතියක සේවාවක් නොවන්නේ,

   (1) ක්‍රියාවලි හා ජාල කළමණාකරණය යි. (2) ගොනු හා ආරක්ෂණ කළමණාකරණය යි.
   (3) මතක හා විධාන කළමණාකරණය යි. (4) උපාංග හා ගොනු කළමණාකරණ යි.

7. පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ මොනවා ද?

A. පරිගණකය හා පරිශීලකයා අතර සම්බන්ධතාවය ඇති කරනු ලබන මෘදුකාංගය මෙහෙයුම් පද්ධතිය වේ.
B. මෙහෙයුම් පද්ධතිය මඟින් පරිශීලකයාට අවශ්‍ය යෙදවුම් මෘදුකාංග ක්‍රියාකිරීමට අවශ්‍ය පරිසරයක් ඇති නොකරයි.
C. මෙහෙයුම් පද්ධතියක, ඒක පරිශීලක හා බහු පරිශීලක ලෙසත් ක්‍රියාකාරීත්වය දැක්විය හැකිය.

(1) A හා C (2) A හා B (3) B හා C (4) A, B හා C

8. වදන් සකසන මෘදුකාංගවල සාමාන්‍යයෙන් භාවිත වන කෙටි මං යතුරු සම්බන්ධව පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න.

A - Ctrl + C යන්න පාඨ/ වස්තු කොපි කිරීම (copy) සඳහා භාවිත කරයි.
B - Ctrl + A යන්න ලේඛනයක ඇති සියළු පාඨ/ වස්තු තේරීම (select) සඳහා භාවිත කරයි.
C - Ctrl + V යන්න කොපි කරන ලද පාඨ/ වස්තු ඇලවීම (paste) සඳහා භාවිත කරයි.

ඉහත වගන්ති අතරින් නිවැරදි වන්නේ මොනවා ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) ඉහත සියල්ලම

9. වදන් සකසන මෘදුකාංගයක් භාවිතයෙන් A වගන්තිය, B වගන්තිය ලෙස හැඩසව් (formatting) කර ඇත.

A වගන්තිය - Sri Lanka is surrounded by the Indian Ocean.
B වගන්තිය - <u>*Sri Lanka is surrounded by the Indian Ocean.*</u>

A වගන්තියට, B වගන්තියේ පෙනුම ලබා ගැනීම සඳහා පහත කවර මෙවලම් භාවිත කළ යුතු ද?

(1) (2) (3) (4)




10. වදන් සැකසුම් මෘදුකාංගයක පවතින පහසුකම් වන්නේ පහත සඳහන් ඒවායින් කවරක්ද?

A - සොයා ප්‍රතිස්ථාපනය කිරීමේ පහසුකම (find and replace)
B - තැපැල් මුසුව (Mail merge)
C - අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ දෝෂ සෙවීම හා නිවැරදි කිරීම සහ ශබ්ද නිධිය (spell check and Thesaurus)

(1) A පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) ඉහත සියල්ලම

11. වදන් සැකසුම් ලේඛනයක ඇති $X = n_1+n_2$ යන සමීකරණය සලකන්න. වදන් සැකසුම් පැකේජයක ඇති පහත කුමන අංකයෙන් දැක්වෙන මෙවලම මඟින් 1 හා 2 සංඛ්‍යා, සමීකරණයේ පෙන්වා ඇති ආකාරයට දර්ශනය කළ හැකි වේ ද?

(1) අකුරු වර්ගයෙහි මුහුණත (font face) වෙනස් කිරීම
(2) අකුරු වර්ගයෙහි ප්‍රමාණය (font size) වෙනස් කිරීම
(3) යටි ලකුණ (subscript)
(4) උඩු ලකුණ (superscript)

12. පහත සඳහන් කුමක් වලංගු sum ශ්‍රිතය/ශ්‍රිතයක් වේද?

A - =sum(A2,A3:A5)
B - =sum(A3:A7)
C - =sum(A3,A4,A7)

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි (4) ඉහත සියල්ලම

13. පැතුරුම් පත් මෘදුකාංගයක යෙදුමකදී (spread sheet application) භාවිත වන කෝෂ ලිපින (cell address) නිවැරදි ආකාරයෙන් දක්වා ඇත්තේ පහත ඒවායින් කවරක ද?

A - C\$5 B - \$C5 C - C5\$

(1) A හා B පමණි (2) B හා C පමණි (3) A හා C පමණි (4) ඉහත සියල්ලම

14. පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) Google sheets (2) apple number
   (3) Microsoft excel (4) open office writer

15. පහත ශ්‍රිත අතරින් නිවැරදි වන්නේ කුමක් ද?
   (1) =SUM(A2:D4) (2) =AVG(C2:D4)
   (3) =TOT(D1:H7) (4) =AVERAGE(A3 TO D5)


16. පැතුරුම්පත්වලදී භාවිත වන ප්‍රස්තාර ආකාරයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) ස්තම්භ ප්‍රස්තාර (2) වට ප්‍රස්තාර
   (3) රේඛා ප්‍රස්තාර (4) කෝණ ප්‍රස්තාර


17. ස්ථානය ලබා දීම සඳහා භාවිත වන ශ්‍රිතය නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහි ද?
   (1) =ORDER(A2,A2:A9) (2) =RANK(A2,A2:A9)
   (3) =ORDER($A$2,$A$2:$A$9) (4) =RANK(A2, $A$2: $A$9)

18. ඉ-සමර්පණ මෘදුකාංගයේ සමර්පණ රාමුදසුන (slide Show) වෙත පිවිසිය හැකි නිරූපකය කුමක්ද?

   (1)  (2)  (3)  (4) 

19. පහත කුමන මෙවලම විද්‍යුත් සමර්පණ මෘදුකාංගයක කදාවක සැකසුම (style) පළමු සැකසුම සිට දෙවන සැකසුම වෙත වෙනස් කිරීම සඳහා භාවිතා කල හැකිද?


පළමු සැකසුම


දෙවන සැකසුම

   (1) කදා නිර්මාණය (Slide Design) (2) කදා තෝරනය (Slide Sorter)
   (3) කදා පිරිසැලසුම (Slide Layout) (4) කදා දසුන (Slide view)

20. ගුණාත්මක ඉලෙක්ට්‍රොනික සමර්පණයක අඩංගු විය යුතු ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) අකුරුවල විශාලත්වය පොයින්ට් 32ක් හෝ ඊට වඩා වැඩි වීම.
   (2) එක් කදාවක අඩංගු පේළි ප්‍රමාණය පේළි 9-6 අතර වීම.
   (3) අරමුණු ඉලක්ක කරගත් අදහස් පමණක් ඇතුලත් වීම.
   (4) චිත්‍රක ,වගු හෝ ප්‍රස්තාර නොමැතිව සමර්පණ සැදීමට පෙළඹීම .

21. ඉ-සමර්පණමෘදුකාංගයේ සමර්පණ රාමු දසුන (slide Show) වෙත පිවිසීමට භාවිතා කල හැකි කෙටි මං යතුර කුමක්ද?
   (1) Ctrl+S (2) F5 (3) Ctrl+N (4) F2

පහත දත්ත සමුදාය වගුව ඇසුරින් 22 හා 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ItemID | I_Name | Stock |
|---|---|---|
| 1001 | Pencil | 35 |
| 1002 | Lunch Box | 15 |

22. ඉහත වගුවේ අඩංගු ක්ෂේත්‍ර හා රෙකෝඩ ගණන පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) 2,3 (2) 3,2 (3) 3,3 (4) 2,4

23. Stock ක්ෂේත්‍රය සඳහා භාවිතා කළ හැකි දත්ත ප්‍රරූපය කුමක්ද?

(1) පාඨ (Text) (2) සංඛ්‍යා (Number)
(3) බූලියන් (Boolean) (4) මුදල් (Currency)

24. පහත සඳහන් ඒවා අතරින් දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් නොවන්නේ කුමක් ද?

(1) MS Access (2) Oracle (3) Calc (4) Base

25. වගුවකට නව රෙකෝඩ ඇතුලත් කිරීමට හා පවතින රෙකෝඩ වෙන් වෙන් වශයෙන් දර්ශනය කර ගැනීමට භාවිතා වන්නේ මොනවා ද?

(1) ආකෘති පත්‍ර (Form) (2) වගු (Table)
(2) විමසුම් (Query) (4) වාර්තා (Report)

26. ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග පිළිබඳව පහත දී ඇති වගන්ති අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) audacity යනු ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයකි.
(2) WAV, AIFF, FLAC, MP2, MP3 ගොනු ආකෘති වලින් දක්නට ලැබේ.
(3) මෙවැනි සංස්කරණයක අරමුණ වන්නේ ශබ්ද පිටපත් කිරීම, මිශ්‍ර කිරීම, හෝ ඒකාබද්ධ කිරීමකි.
(4) පටිගත කිරීම්වල වේගය වෙනස් කළ නොහැක.

27. ශ්‍රව්‍ය සන්ධාර නිර්මාණය සඳහා භාවිතා වන මෘදුකාංගයක් වන්නේ මේ අතරින් කවරක් ද?

(1) YouTube Remixer (2) Stash space
(3) AVI Edit (4) Power sound Editor

28. අන්තර්ජාලය (Internet) සහ ලෝක විසිරි වියමන (World Wide Web – www) සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(1) අන්තර්ජාලය යනු WWW හි සේවාවකි.
(2) අන්තර්ජාලය හා WWW අතර සම්බන්ධතාවයක් නැත.
(3) අන්තර්ජාලය හා WWW යනු එකම වේ.
(4) WWW යනු අන්තර්ජාලයෙහි සේවාවකි.

29. පහත ඒවායින් සෙවුම් යන්ත්‍රයක් (search engine) වන්නේ කුමක් ද?

(1) Outlook Express (2) Internet Explorer
(3) Google (4) Macromedia Flash

30. HTML භාවිතයෙන් පාඨ (TEXT) අවධාරණය කර පෙන්වීම සඳහා පහත කවර HTML උසුලනය (tag) භාවිතා කළ හැකි ද?

(1) <sup> (2) <p> (3) <em> (4) <i>

31. විස්තරාත්මක ලැයිස්තුවක ආරම්භය සඳහා යොදා ගත හැකි නිවැරදි උසුලනය කුමක් ද?

(1) dt (2) dl (3) dd (4) ol

32. http://www.minuedu.lk වෙත "Zonal Eduaction Office - Minuwangoda "අධිසන්ධානය (hyperlink) තනා ගැනීම සඳහා නිවැරදි HTML කේතය කුමක් ද?

(1) <a> http://www.minuedu.lk </a>
(2) <a type=" http://www.minuedu.lk ">Zonal Eduaction Office - Minuwangoda </a>
(3) <a href=" http://www.minuedu.lk ">Zonal Eduaction Office - Minuwangoda </a>
(4) <a hrf=" http://www.minuedu.lk ">Zonal Eduaction Office - Minuwangoda </a>

33. පහත දැක්වෙන මෘදුකාංග සලකන්න.

A. සරල පාඨ සංස්කාරක (simple text editor)

B. වෙබ් සංස්කාරක මෘදුකාංග (Web authoring software)

C. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංග (Spreadsheets software)

ඉහත දැක්වෙන කුමන මෘදුකාංගය/ මෘදුකාංග HTML ලේඛණයක් නිර්මාණය කිරීමට භාවිත කළ හැකි ද?

(1) B පමණි. (2) A හා B පමණි. (3) B හා C පමණි. (4) A,B,C සියල්ලම.

34. HTML භාවිතයෙන් අංකිත ලැයිස්තුවක් (numbered list) ලබා ගැනීම සඳහා කවර HTML උසුලනය (tag) භාවිත කළ හැකි ද?

(1) <ol> (2) <dl> (3) <li> (4) <tr>

35. වෙබ් පිටු සංවර්ධනය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කුමන වගන්ති ද?

A - වෙබ් පිටු නිර්මාණය සඳහා වෙබ් කර්තෘ මෙවලම් (web authoring tools) භාවිත කළ හැකි ය.

B - ගතික වෙබ් පිටු නිපදවීමට HTML පමණක් භාවිත වේ.

C - ගතික වෙබ් පිටුවලින් (dynamic web pages) පෙන්වන සන්ධාරය (content) පරිශීලක ආදාන අනුව හෝ කාලය අනුව හෝ වෙනස් විය හැකිය.

(1) A හා C පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) A,B,C සියල්ලම

36. වෙබ් අතිරික්සුවක් මගින විදැහු (render) කළ පහත ලැයිස්තුව සලකන්න.

• Disk Partitioning
• Disk Formatting
• Defragmentation

ඉහත ලැයිස්තුව නිර්මාණය කිරීමට අදාල වන HTML උසුලන මොනවාද?

(1) <dl> , <dt> (2) <dl> , <li>

(3) <ol> , <li> (4) <ul> , <li>

37. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ භාවිතයන් ආශ්‍රිත පහත වගන්ති අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) හෘද රෝග තිරගැන්වීමේ යන්ත්‍රය මගින් හෘද ස්පන්දනය නිරීක්ෂණය කරයි.

(2) මාර්ගගත සාප්පු සවාරි මගින් විදේශීය වෙළඳපොලේ ඇති භාණ්ඩ පමණක් ඇනවුම් කළහැක.

(3) ගොවිපළ කළමනාකරණය සඳහා පරිගණක යෙදුම් භාවිත කරයි.

(4) සිසුන් අන්තර්ජාලය භාවිතයෙන් ඉ- පොත්පත් කියවීම තොරතුරු තාක්ෂණයේ අනිසි ප්‍රතිඵලයකි.

38. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමගම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ සාධනීය ලක්ෂණ ලෙස සැලකිය නොහැක්කේ කුමක් ද?

(1) අධ්‍යාපනික වැඩසටහන් නැවත නැවත භාවිතයට ගත හැකි වීම.

(2) දුරස්ථ අධ්‍යාපනය මගින් අධ්‍යාපනය සිදු කළ හැකි වීම.

(3) වෙබ් ආධාරක ඉගැන්වීම මගින් පරිගණක වෛරස පැතිරීම.

(4) විද්‍යුත් අධ්‍යාපනය මගින් එකවර බොහෝ සිසුන් පිරිසකට අධ්‍යාපනය සිදු කළ හැකි වීම.

39. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ රැකියා අවස්ථාවක් නොවන්නේ කුමක් ද?

(1) මෘදුකාංග ඉංජිනේරු (2) චිත්‍රක නිර්මාණකරු

(3) මෘදුකාංග නිර්මාණ ශිල්පී (4) ආයතන පරිපාලක

40. ඊ අපද්‍රව්‍ය පිළිබඳ වඩාත් නිවැරදි නිර්වචනය කුමක්ද?

(1) භාවිතයෙන් ඉවතලන සියලුම විද්‍යුත් උපකරණ ආශ්‍රිත ද්‍රව්‍යයි.

(2) ඊ අපද්‍රව්‍ය සාමාන්‍ය පරිදි බැහැර කිරීමේ හැකියාව ඇත.

(3) ඊ අපද්‍රව්‍ය බැහැර වන්නේ කර්මාන්ත ශාලා ආශ්‍රිතව පමණි.

(4) ඊ අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාව තුළ නොමැත.

# පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය - 01
## 11 පත්‍රය

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

01. (i) පද්ධතියක මූලිකාංග නම් කරන්න.

(ii) පද්ධතියක භාවිතා වන ආදාන උපාංග දෙකක් හා ප්‍රතිදාන උපාංග දෙකක් ලියා දක්වන්න.

(iii) පහත ආචයන උපාංග අතරින් ප්‍රාථමික ආචයන උපාංගය තෝරන්න.
(දෘඪ තැටිය , ප්‍රකාශ තැටිය, සසම්භාවී පිවිසුම් මතකය (RAM) , පඨන මාත්‍ර මතකය (ROM))


(iv) මෙහෙයුම් පද්ධතිවලින් ඉටුවන එක් කාර්යයක් සඳහන් කරන්න.

(v) පහත සංඛ්‍යා කුමන සංඛ්‍යා පද්ධතිවලට අයත් විය හැකිද? (ද්විමය, අෂ්ටමය, දශමය සහ ෂඩ්දශමය ලෙස දක්වන්න.)

(a) 1011 (b) 964

(vi) පහත දක්වා ඇති බූලියානු ප්‍රකාශවලට අදාල තාර්කික පරිපථය අඳින්න.
F= A.B + B.C

(vii) පහත දැක්වෙන පරිපථයට අදාල බූලියානු ප්‍රකාශනය ලියන්න.




02. (a) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ලියා දක්වන්න.


(i) ගොනුවක් ගොනු නාමය හා දිගුවක් ලෙස කොටස් දෙකකි.
(ii) ගොනුවේ දිගුවෙන් මෙහෙයුම් පද්ධතියේ ගොනු වර්ගය හඳුනාගත නොහැකිය.
(iii) මෙහෙයුම් පද්ධතියෙන් පරිශීලකයාට අතුරුමුහුණතක් ලබාදෙයි.
(iv) පරිගණකයක සියලුම පර්යන්ත උපාංග මතක කලමණාකරනය මඟින් පාලනය කරනු ලබයි.
(v) දෘඩතැටියක් අවශ්‍ය පරිදි කොටස්වලට බෙදා වෙන් කිරීම පංගු බෙදීම වේ.
(vi) කාර්යය කළමනාකරණය මඟින් පරිගණකය තුල ක්‍රියාත්මක වන ක්‍රමලේඛන හා ක්‍රියාවලීන් පිළිබඳ කළමනාකරණය සිදු නොකරයි.

(b) (i) ඒකාකාර සම්පත් නිශ්චායකය (URL) යනු කුමක්ද?

(ii) විද්‍යුත් තැපැලේ වාසි 2 ක් ලියන්න.

(iii)වෙබ් අතරික්සු (web browser) හා සෙවුම් යන්ත්‍ර (Search engine) සඳහා උදාහරණ 2 බැගින් ලියන්න.

(c) පරිශීලකයා හා පරිගණකය අතර සම්බන්ධතාවය දැක්වෙන පහත සටහනේ 1, 2, 3 හිස්තැන්වලට ගැලපෙන නිවැරදි පද යොදන්න.




03. (a) වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් කොටසක් හැඩසව් ගන්වන ලද පාඨ ලේඛනයක් පහතින් දැක්වේ. මෙම ලේඛනයෙහි හැඩසව් ගැන්විය යුතු අංග A සිට E දක්වා වන ලේබල මගින් දක්වා ඇත.



A → **Welcome to Esoft**

As the largest, private sector, highest education network in Sri Lanka with 40 centers island wide. **ESOFT** creates opportunities for over 30,000 students every year.

Science our inception in ***2000***, we have built a solid reputation for delivering high quality and affordable academic programmes ranging from certificate to postgraduate level across a variety of disciplines including.


B C D

- Computing
- Business
- Hospitality
- Engineering
- Language Training
- Personal and professional Development

E

Source: http://esoft.lk

ඉහත ලේඛනය හැඩසව් ගැන්වීම සඳහා භාවිත කෙරෙන වදන් සැකසුම් මෘදුකාංගයක අතුරු මුහුණතෙහි ඇති මෙවලම් තීරුව පහතින් දක්වා ඇත. එහි ඇතැම් මෙවලම් අංක 1 සිට 16 දක්වා ලේබල කර ඇත.




A සිට E දක්වා කාර්යයන් සපුරා ගැනීමට අවශ්‍ය මෙවලම් 1-16 දක්වා ඇති මෙවලම් අතරින් තෝරා ලියන්න.

(b) (i) වදන් සැකසුම් මෘදුකාංගයකින් ඉටුකරගත හැකි කාර්යයන් 3 ක් ලියන්න.

(ii) වදන් සැකසුම් මෘදුකාංග සඳහා උදාහරණ 3 ක් ලියන්න.

04. පහත දක්වා ඇත්තේ ආයතනයක වැටුප් ගෙවීම් සම්බන්ධ ලේඛනයකට අදාළ වැඩපතකි. එම වැඩපත භාවිතයෙන් පහත දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | ABC COMPANY | | | | | |
| 2 | EMP_NO | NAME | SALARY | SALES AMOUNT | COMMISSION | TOTAL SALARY |
| 3 | S101 | Mr. Ruwan | 1600 | 2500 | | |
| 4 | S105 | Mr.Perera | 1800 | 3000 | | |
| 5 | S112 | Mrs. Fernando | 1500 | 2200 | | |
| 6 | S107 | Mr.Silva | 2000 | 4500 | | |
| 7 | S110 | Mrs.Kumari | 1700 | 3500 | | |
| 8 | S103 | Mr. Ruwan | 1600 | 2500 | | |
| 9 | | | | | | |
| 10 | | TOTAL | | | | |
| 11 | | AVERAGE | | | | |
| 12 | | HIGHEST | | | | |
| 13 | | LOWEST | | | | |
| 14 | | COUNT | | | | |

(i) ABC COMPANY මාතෘකාවට අදාලව භාවිතා කර ඇති හැඩසව් කිරීම් මොනවා ද?

(ii) සේවකයාට හිමි වැටුප (TOTAL SALARY) ගණනය කිරීමට F3 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියන්න.
(TOTAL SALARY=COMMISSION+SALARY),(COMMISSION=SALES AMOUNT*3%)

(iii) එම සූත්‍රය F7 කෝෂයට පිටපත් කළ විට දිස් වන්නේ කෙසේද?

(iv) සියලුම සේවකයින්ගේ වැටුපෙහි එකතුව ගණනය කිරීමට C10 කෝෂයට ඇතුළත් කළ යුතු ශ්‍රිතය කුමක්ද?

(v) සියලුම සේවකයන්ගේ වැටුපෙහි සාමාන්‍ය ගණනය කිරීමට අදාල ශ්‍රිතය C11 දැක්වෙන්නේ කෙසේද?

(vi) සේවකයන් ලබන උපරිම වැටුප (MAXIMUM) හා අවම වැටුප (MINIMUM) සෙවීම සඳහා C12 ,C13 කෝෂවල දැක්විය යුතු ශ්‍රිත මොනවද?

(vii) වැටුප් ලේඛනයෙහි සිටින සේවකයන් ගණන සෙවීම සඳහා අදාළ ශ්‍රිතය C14 කෝෂයෙහි දැක්වෙන්නේ කෙසේද?

(viii) එක් එක් සේවකයාට හිමි වැටුප ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ප්‍රස්තාර වර්ග දෙකක් නම් කරන්න.

05. ( a) පහත දැක්වෙන්නේ ව්‍යාපාරික තොරතුරු ඇතුළත් දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| Sales Table | | |
|---|---|---|
| Month | Shop ID | Sales |
| March | 001 | 13500 |
| April | 001 | 17800 |
| June | 003 | 14530 |
| July | 001 | 12340 |
| August | 002 | 15630 |

| Branch Table | | |
|---|---|---|
| Name | Shop ID | Category |
| LMN Company | 001 | A |
| RST Company | 002 | B |
| PQR Company | 003 | C |

| Category Table | |
|---|---|
| Category | Item |
| A | Ice cream & Milk |
| B | Milk |
| C | Milk & Stationery |

(i) මෙම වගුවල ඇති රෙකෝඩ හා ක්ෂේත්‍ර ගණන වෙන් වෙන්ව සඳහන් කරන්න.

(ii) මෙම වගුවල අන්තර්ගත ප්‍රාථමික යතුරු හා ආගන්තුක යතුරු 2 බැගින් ඒවාට අදාළ වගු නාම සමඟ ලියා දක්වන්න.

(iii) එක් එක් වෙළඳසැලේ දුරකතන අංකය ඇතුලත් කිරීමට අවශ්‍ය නම් , වෙනස් කළ යුතු වගුව කුමක් ද?

(iv) LMN Company හි total sales සොයා ගැනීම සඳහා විමසුමක් ක්‍රියාත්මක කිරීමට බද්ධ කළ යුතු වගු මොනවාද?

(v) Shop ID 004 වූ නව වෙළඳ සැලක් Milk & Photocopying අලෙවිය සඳහා ABC Company හි විවෘත කළේ නම්, මෙම තොරතුරු ඇතුලත් කිරීම සඳහා යාවත්කාලීන කළ යුතු වගු මොනවා ද ?

(vi) ඉහත 5 හි සඳහන් අළුතින් එකතු කරන ලද රෙකෝඩ ඒවාට අදාළ වගු නාම සමගින් ලියා දක්වන්න.

( b) සමර්පණ මෘදුකාංගය පිළිබඳව පහතින් දක්වා ඇති වාක්‍යවලට සුදුසු වචන පහතින් දී ඇති පද පෙළින් තෝරා ලියන්න.

(i) කදාවක සිට තවත් කදාවකට ගමන් කිරීමේදී කදාව චලනය කර ගැනීමට .................................. යොදා ගනී.

(ii) Ctrl + N යන කෙටි මං යතුරු භාවිතයෙන් සමර්පණය සඳහා .................................. ලබා ගත හැකිය.

(iii) කදාව තුළ අන්තර්ගත විය යුතු කරුණු අනුව ........................................ මඟින් සුදුසු කදාවක් තෝරා ගැනීමේ හැකියාව ඇත.

(iv) කදා දැක්ම අවස්ථාවේ පවතින සමර්පණයකින් ඉවත් වීම සඳහා............................ යතුර භාවිතා කල හැකිය.

(v) සමර්පණය තුළ පවතින කදා සියල්ලම එකවර දර්ශනය කර .................................. මඟින් අවශ්‍ය පරිදි පිළිවෙල මාරු කළ හැකිය.

(vi) විද්‍යුත් සමර්පණය තුළ පවතින සියළුම කදා එකලෙස සකස් කර ගැනීමට .................................... භාවිතා කළ හැකිය.

(පද ලැයිස්තුව - කදා සජීවනය (Slide animation), F5, නව කදාවක් (New Slide), Esc, කදා සංක්‍රාන්තිය (Slide Transition),කදා පිරිසැලසුම (Slide layout), ගුරු පිටු (Slide Master), කදා තෝරනය (Slide sorter) )

06. (a) පහත දැක්වෙන වෙබ් පිටුවට අදාල HTML කේත පහත දැක්වේ. එහි 1 සිට 10 දක්වා ඇති අංකවලට අදාල කේත පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

ලැයිස්තුව:- {i, ul , p , font , h1 , title , a , head , tr , hr , b , th , u , h2, dl , ol, center, href}




```
<html>
<head>
<(1)> Storage Devices</(1)>
</head>
<body>
<(2)><(3)> Computer Memory </(3)> </(2)>
<(4)>  Storage devices are used to store data and information </(4)> <br><br>
<(5)> Secondary memory </(5)>
<(6)> <(7)> Secondary memory </(7)>  or <7> the secondary storage </7> is the device which stores data and
information permanently.<br>
These can be classified as follws</(6)>
<(8)>
<li> Maganetic media devices </li>
<(9)>
<li> Hard disk</li> <li> Floppy disk</li> <<li> Magnatic Tape</li>
</9>
<li> Optical media devices </li>
<9>
<li> CD</li> <li> DVD</li> <<li> Blue ray</li>
</9>
<li> Solid state devices </li>
<9>
<li> USB flash </li> <li> Memory card</li> <<li> Magnetic Tape</li>
</9>
</8>
<6> If you want to study input devices
<a (10)="www.tutorials.lk"> Visit the page </a>
</body>
</html>
```

(b) (i) අන්තර්ජාලය මගින් සපයන සේවාවන් දෙකක් ලියන්න.

(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පවතින රැකියා අවස්ථා තුනක් ලියන්න.